# සිඛවළඳ හා සිඛවළඳ විනිසෙහි එන භික්ෂු විනය ශික්ෂා පද පිළිබඳ විචාර පූර්වක අධ්‍යයනයක්

පදියතලාවේ අමරවංශ හිමි[1]

සිඛවළඳ හා සිඛවළඳ විනිස අනුරාධපුර යුගයට අයත් ඉපැරණි සිංහල ගද්‍ය ග්‍රන්ථයකි. භික්ෂුන්ගේ විනය ශික්ෂාපද මෙහි දක්වයි. සිඛවළඳ හා සිඛවළඳ විනිස නමින් කොටස් දෙකක් වෙයි. දෙකොටසින් කරනුයේ කාර්යයන් දෙකකි. සිඛවළඳ විනය පිටකයෙහි ආ විනය ශික්ෂාපද සැකෙවින් දක්වයි. සිඛවළඳ විනිස සිඛවළඳෙහි ආ ශික්ෂාපද වැඩිදුරටත් විස්තර කරයි. කොටස් දෙකක් වුවද මෙය එක් පොතකි. ඒ බව ''අටුවා පාඨ උදෙස් බලා මුල් සිඛ හා සිඛවළඳ හා සිඛවළඳ විනිස මවිසින් කරන ලද්දේයි'' යන පාඨයෙන් දක්වයි.

මෙය සමස්ත විනය පිටකය අළලා ලියැවුණක් වුවද කරුණු සැකෙවින් දක්වයි. සිඛවළඳ '' තුන් ලොවට උතුම් රුවන්තියා කාවිසි මුනි තුන් දොරින් සකසා වැඳ උපසපුව ලද පැවිජ්ජා පටන් හික්මියැ යුතු සිරිත් විරිත් සිඛ සැබෙවින් කියනෙමි' යන්නෙන් අරඹයි. සිඛවළඳ විනිස '' තුන් ලොවට උතුම් රුවන්තියා වැඳ උපසපුව ලද පැවිජ්ජා පටන් හික්මෙනුව වස් කළ සිඛ වළඳ විනිස සැකෙවින් කියනෙමි' ලෙස දක්වයි.

විනයෙහි ආ ශික්ෂා පද දැක්වීම මෙහි විෂයය වුවත් විනයෙහි සියලුම ශික්ෂාවන් මෙහි නොදක්වයි. ශික්ෂා පද  එකසිය පණහකට වැඩි ගණනක් මෙහි ඇතුළත් වෙයි. සංඝාදිසේස දහතුනක් ඇතත් හතක් පමණක් ඉදිරිපත් කරයි. හයක් අතහැර දමයි. අනියත දෙකම නොදක්වයි. නිස්සග්ගිය තිහෙන් දහතුනක් පමණක් ගනියි. දා හතක්ම අත්හරියි. පාචිත්තිය අනූ දෙකින් ගෙන ඇත්තේ හතළිස් එකක් පමණි. පනස් එකක්ම නොගනියි. ශික්ෂාපද සැකෙවින් දක්වන බැවින් උපසපන් භික්ෂුන්ට ඇවැසි ශික්ෂා පද පමණක් දැක්වීමට පෙළඹුණු බැවින් සෙසු ශික්ෂා පද ඉවත් කළා විය හැකි ය. ග්‍රන්ථයෙහි එන ශික්ෂාපද වලින් සිවු පරිජි, සත් සඟ වෙසෙස්, තුදුස් නිසැගි, එක් සාලිස් පචිති, පකිණ්ණක වාරිත්‍ර ලෙස ද, ඇඳුරුවත්, තෙරවත්, පොහෝ පවුරුණු විධි චාරිත්‍ර ලෙස ද ග්‍රන්ථයට ඇතුළත් කරයි.

සිඛවළඳ හා සිඛවළඳ විනිසෙහි එන ඉහත ශික්ෂා පද විනය පිටකය හා තුලනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

ප්‍රමුඛ පද : සිඛවළඳ, සිඛවළඳ විනිස, සැබෙවින්, උපසපන්, පරිජි, සඟ වෙසෙස්, නිසැගි, පචිති, පකිණ්ණක

1 පූර්ව උපාධි අපේක්ෂක සිව්වන වසර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
mahelepola@yahoo.com